# ගොයමෙහි වල් මර්ධනයට වැඩි දියුණු කළ පරිසර හිතකාමී අසකුරාගේ ලී සපත්තුව

**වී** වගාවේ දී පැළෑටි මර්දනය කිරීම සඳහා වර්තමාන ගොවීන් බහුල ලෙස කෘමිනාශක යොදන අතර එමගින් පරිසරයට මෙන් ම සෞඛ්‍යයට ද තර්ජනයක් පවතී. එබැවින්, සුළු වියදමකින් සාදා ගත හැකි මෙවලමක් මගින් ගොයමේ වල් පැළෑටි මර්දනය කළ හැකි බැවි ජපන් ජාතිකයෙකු වන අසකුරා මහතා විසින් අතීතයේ සොයා ගෙන තිබේ. මෙය ලී සපත්තුවකි. මෙම ලී සපත්තුව වැඩි දියුණු කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ ගොවීන් අතරට ද ගෙන යා හැකි බැවින් එහි විස්තර පහත සඳහන් වේ.

i. ගොයම් පැළ 3-4ක් සෙ.මී. 24 පේළිවල සෙ.මී. 10ක් දුරින් සිටුවන්න

ii. සති 2-3ක දී හා සති 4-6 දී ලී සපත්තුව පැළඳගෙන පේළි අතර ඇවිදින්න.

iii. වල් පැළ සෙ.මී. 8-10 ගැඹුරට මඩ තුළ ගිල්වීම, මඩ බුරුල්වීම නිසා ගොයම හොඳින් වර්ධනය වේ.


iv. මෙතෙක් කරන ලද අත්හදා බැලීම්වල දී අහඹු ලෙස සිටුවන ලද ගොයමට වඩා 25%-50% අතර වැඩිවීමක් නිරීක්ෂණය කොට ඇත.

**විශේෂ වාසි**

* වැඩියෙන් පඳුරු දැමීම, හොඳ වාතාශ්‍රය හා හොඳින් හිරු එළිය ලැබීමෙන් වැඩි අස්වැන්නක් ලැබේ.
* වල් නාශක සඳහා වියදම සහ විදේශ විනිමය වැඩිවීම වැළකේ. (අක්කරයකට රු. 2000 පමණ.)
* අනෙකුත් පළිබෝධ හා රෝග අඩු වේ.
* පරිසර දූෂණය අවම වේ.
* සෞඛ්‍යයට හිතකර වේ.
* ග්‍රාමීය මට්ටමින් නිෂ්පාදන කළ හැකි ය.

මෙම මෙවලම වැඩි දියුණු කරන ලද්දේ කෘෂි ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඩබ්.ඒ.එම්.පී. වික්‍රමසිංහ මහතා, කෘෂි උපදේශක, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගිනි.

*(මෙම විස්තරය උපුටා ගන්නා ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් බටඅත, කෘෂිකර්ම තාක්ෂණ පර්යේෂණ ආයතනයේ පැවති ගොවි සතිය ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියේ විස්තරයක් ආශ්‍රයෙනි.)*




සරත් විජයගුණවර්ධන

*අංලෙව් සහකාර/මාධ්‍යවේදී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.